**මිල්ලනිය ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතියේ පරිච්ජේද අංක 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූල නොවන ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අතිරික්තයට ගැලපුම් කිරීමේදී රු.1,367,315 ක් වූ ආයෝජන ආදායම අඩු කර දක්වනු වෙනුවට රු.1,750,745 ක් ලෙස එකතු කර දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රමිතියේ පරිච්ජේද අංක 3.6 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියළු වටිනාකම් සඳහා පෙර වර්ෂයේ තුලනාත්මක තොරතුරු දක්වනු වෙනුවට 2021 වර්ෂයේ තොරතුරු දක්වා තිබුණි. | -එම- | -එම- |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොග ශේෂය තුළ ඇතුලත් විදුලි ගබඩා තොගය හා ලිපි ද්‍රව්‍ය තොගය පිළිවෙලින් රු.817,069 ක් හා රු.306,521 ක් නැවත ගබඩා | වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| අත්තිකාරම් තොග ශේෂයේද ඇතුලත් කර තිබුණි. | | |
| (ආ) 2022 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්වලින් එකතුව රු.497,060 ක් වැඩියෙන් ආදායමට හඳුනාගැනීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා ලැබීම් ගිණුම හර කර තිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් නිවැරදිව ආදායමට හඳුනාගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මෝටර් වාහන, පරිගණක, කාර්යාල උපකරණ, බඳුන් හා උපකරණ, පාරවල් හා බෝක්කු සහ පුස්තකාල පොත් ක්ෂය රු.6,134,086 ක් විය යුතු වුවත්, එය රු.6,073,119 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | වත්කම් ක්ෂය කිරිම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීම්, බඳුන් හා උපකරණ ක්ෂය වෙන් කිරීම් පිළිවෙලින් රු.675,998 කින් හා රු.246,646 කින් බැර කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල රු.792,629 ක් ලෙස එනම් රු.116,631 ක් වැඩියෙන් හා රු.584,924 ක් ලෙස එනම් රු.338,278 ක් වැඩියෙන් හා ගැලපුම් කර තිබුණි. | 2024 ගිණුම සකස් කිරිමේදි ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව . | ගිණුම් නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. |

## 1.6.3 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා**

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල /ලෙජර්වල දැක්වෙන ශේෂයන් අතර රු.9,551,676 ක වෙනසක් විය. | 2024 ගිණුම සකස් කිරීමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව . | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ127 වගන්තිය. | සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි 22 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් වෙත සුසානභූමි පවරා ගැනීමට අදාල අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව. | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 07ක ඉන්ධන දහනයන් වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව 2024 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කර ඇති බව. | -එම- |
| (ඇ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 299 | සමාලෝචිත වර්ෂයෙහි මාර්තු 31 දිනට නොගෙවන ලද කර්මාන්ත බද්දට සහ ව්‍යාපාර බද්දට යටත් දේපළ හා පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තු සකස් කර අප්‍රේල් 30 දිනට ප්‍රථම සභාවේ ලේකම් වෙත වාර්තා කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | 2016 පෙබරවාරි 29 දිනැති අංක 01/2016 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛයේ 2.2.3 සහ 2.2.5 ඡේද | සභාවේ කැබ් රථය අළුත්වැඩියාව සඳහා ලබා ගත් මිල ගණන්වල සාධාරණ බව යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් සනාථ කර නොතිබුණු අතර අළුත්වැඩියාව පිළිබඳ සෑහීමකට පත්වන බවට රියදුරුගෙන් සහතිකයක්ද ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.24,445,211 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.6,637,183 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,440,600 | 4,025,951 | 4,024,801 | 1,150 | 3,197,440 | 4,433,669 | 4,366,325 | 67,345 |
| (ii) | කුලී | 342,000 | 189,190 | 189,190 | - | 402,000 | 218,362 | 218,362 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 610,050 | 345,750 | 345,750 | - | 1,379,050 | 344,090 | 339,590 | 4,500 |
| (iv) | වෙනත් ආදායම් | 11,810,550 | 9,405,239 | 9,405,239 | - | 39,661,100 | 37,296,591 | 32,847,465 | 4,449,126 |
| | | 17,203,200 | 13,966,130 | 13,964,980 | 1,150 | 44,639,590 | 42,292,712 | 37,771,742 | 4,520,971 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,202,500 ක් හා මුද්දර ගාස්තු රු.7,237,656 ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණු ව්‍යාපාර ආයතන 35 කට සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබා දී තිබූ අතර එම ආයතනවලට එරෙහිව නිතීමය පියවර ගෙන නොතිබුණි. | අදාල ආයතන සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව. | පරිසර බලපත්‍ර ලබාගත් පසු වෙළඳ බලපත්‍රය ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් වෙත ලබාදුන් අත්තිකාරම් පියවීමේදී බිල්පත්වලට අමතරව අදාල ආහාර සාම්පල්වල තත්ව පරීක්ෂණ ප්‍රතිඵල ඇතුලත් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වාර්තාව ලබා ගැනීමට කටයුතු කරන බව. | අදාල වාර්තා ලබාගෙන ගැටළු ඇති ආයතන සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගත යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත පිරිවැය රු.3,200,000 වූ යාලගල පන්සල මාවත තාර අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාල බිල් ප්‍රමාණ පත්‍රය හා ද්‍රව්‍ය හා ශ්‍රම වියදම් ඇස්තමේන්තුව නිර්දේශ කර ගැනීමකින් හා අනුමත කර ගැනීමකින් තොරව ව්‍යාපෘතිය ඉටු කර තිබූ අතර විගණනය විසින් විමසුම් කිරීමෙන් පසු එම ලේඛනවල අදාල නිලධාරින් අත්සන් කර තිබුණි. | අදාල නිලධාරින් විසින් නිර්දේශ කර අනුමැතිය ලබාදී අද වන විට අත්සන් කර ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලනය මනා අධික්ෂණයකින් සිදු කළ යුතුය. |